# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,743 — 1959 මැයි 15 වැනි සිකුරාද — 15.5.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | 445 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 448 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| අය-වැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම ... ... | — |
| මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 449 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥා පනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥාපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥාපනත පිළිබඳ ව තවදුරටත් කෙරෙන සංශෝධනවලට ද ඒ ආඥාපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුර ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥා පනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින් දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටු වන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3 ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම වර්ෂයක ආධුනික කාලයකට හෝ වර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් ස්වකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

**4. අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකික යකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූ වෙකි.

**5. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි සිය කැමැත්තෙන්ම සේවයෙන් අස්වුවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඇතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**6. වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

**7.** ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

**8. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

..................................තනතුර සඳහා වූ අයදුම්පත යි

(1) දැන්වීමේ සම්බන්ධය :————.

(2) සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

ජාතිය :————.

(ඉහත සඳහන් 4 වැනි කොන්දේසියේ අර්ථ නිරූපණය අනුව ලාංකිකයෙක් ද නැද්ද යනු සඳහන් කරනු)

(3) සම්පූර්ණ තැපැල් ලිපිනය :————.

(4) වයස හා උපන් දිනය :————.

(5) උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි.)

(6) විවාහක ද අවිවාහක ද ? :————.

(7) අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය (දිනයන් සමඟ)—

(අ) ඉංග්‍රීසි :————.

(ආ) සිංහල/දෙමළ :————.

(8) ඉගෙන ගත් පාඨශාලාව සහ පාඨශාලාවෙන් අස්වූ දිනය : ————.

(9) (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා :————. (දිනයන් හා සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර ද සඳහන් කළ යුතුය.)

(ආ) මීට කලින් ආණ්ඩුව යටතේ සේවය කෙළේ නම් සේවය නතර කිරීමේ හේතුවත් සමඟ සේවය පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

(ඇ) පළාත් පාලන සේවා සාමාජිකයෙක් නම්—

(i) දැනට දරන තනතුරේ නම සහ ශ්‍රේණිය :————.

(ii) දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) පළාත් පාලන මණ්ඩලවල සේවය පිළිබඳ වාර්තා සටහන :————.

(ඈ) සේවා මුක්ත භටයෙක් නම්—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණ දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

(10) සිංහල හා දෙමළ යන භාෂා කියවීම, ලිවීම හා භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාව :————.

(11) විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————. (වෘත්තීය හා ශිල්පීය සුදුසුකම් ආදිය මෙනි)

(12) විශේෂ හිමිකම් ආදියක් ඇතොත් ඒ පිළිබඳ විස්තර : ————.

(අයදුම්කරු ඉල්ලුම්කර සිටින තනතුර වැනි තනතුරක සේවය කිරීමෙන් ලබා ඇති පළපුරුද්ද මෙනි)

(13) තෝරා ගනු ලැබුවහොත්, බලාපොරොත්තු වන වැටුප : ————.

(14) චරිත සහතික ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :————.

(ඒ සහතිකවල මුල් ලිපි නොව ඒවායේ පිටපත් පමණක් ඇමිණිය යුතුයි)

(15) පළාත් පාලන සේවය යටතේ සේවය කෙළේ ද, එසේ නම් කිසියම් අවස්ථාවක සේවය නතර කරනු ලැබුවේද ? ————.

(16) කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

(17) ණයතුරුස් වලින් හෝ මුදල් කරදර වලින් නිදහස් ද : ————.

(18) ප්‍රධාන මුලාදෑනියාගෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරියාගෙන් හෝ සමාදාන විනිශ්චයකාරයකුගෙන් හෝ දේවගැතිවරයකුගෙන් හෝ ලබාගත් පදිංචිය පිළිබඳ සහතික (පදිංචිය පිළිබඳ සහතිකයක් අවශ්‍ය වන අවස්ථාවල දී) : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## පළාත් පාලන සේවය

### තුන් වැනි ශ්‍රේණියේ ජල කර්මාන්ත ෆිටර් තනතුර

පළාත් පාලන සේවයේ තුන් වැනි ශ්‍රේණියට අයත් ජල කර්මාන්ත ෆිටර් තනතුරක් සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 666න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 42 බැගින් 16 වරක් වැඩිවී රුපියල් 1,338 දක්වා නගී. එහි රුපියල් 1,086ක වාර්ෂික වැටුපට ප්‍රථමයෙන් කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස.—59.5.30 දිනට අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. උප්පැන්න සහතිකයේ පිටපතක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. දිව්රුම් පෙත්සම් භාරගනු නොලැබේ.

(ආ) අයදුම්කරුවන්ට වාත්තු කළ යකඩ හා ගැල්වනයිස් යකඩ ජලනල නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම, පුද්ගලික නිවාසවලට ජලය සැපයීම, අලුත් වැල්ව වැද්දීම හා අලුත්වැඩියා කිරීම හා පයිප්ප දැමීම හා පෑස්සීම පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුයි. නිවාසවලට ජලය සැපයීමේ නල සවිකිරීම පිළිබඳව ලංකා කාර්මික විද්‍යාලයෙන් නිකුත් කරනු ලබන සහතික දරන්නන් ගැන විශේෂයෙන් සලකනු ලැබේ.

4. අයදුම්කරුවන්ට පරීක්ෂණයට පෙනී සිටින ලෙස නියම කරනු ලැබිය හැකිය.

5. අතික් කරුණු අතින් තනතුර සඳහා සුදුසුකම් ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා පළාත් පාලන සේවයේ නිත්‍ය තනතුරු දරන තැනැත්තන්ගේ ඉල්ලුම් පත්‍ර සලකා බලනු ලැබේ.

6. මේ ගැසට් පත්‍රයේ හතරවැනි කොටසේ ආරම්භයෙහි පළ කොට තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙළ කොට 1959 මැයි 30 වැනි දිනට හෝ ඊට පළමු මා වෙත (පෞද්ගලික නමට නොවේ) ලැබෙන්නට සැලැස්විය යුතුයි.

8. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. යම්කිසි අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රය ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු නොලැබුව හොත් වහාම ඒ බව පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් තුමා වෙත දන්වා එවිය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බැලීම සඳහා ඇති යම්කිසි හිමිකමක් වෙයිනම් එය නැති වන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ වැඩ බලන සභාපති.

1959 මැයි 8 දින,
තැ. පෙ. 530,
කොළඹ.

---

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයේ වින්නඹු සේවිකා තනතුර

පළාත් පාලන සේවයේ වින්නඹු සේවිකා තනතුරක් සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉල්ලුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කාරිය පළමුවරට ගම්පොළ පළාත් ආණ්ඩු සභාවට පත් කර යවනු ලැබෙයි.

2. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 666න් පටන් ගෙන වර්ෂයකට රුපියල් 42 බැගින් වැඩිවී රුපියල් 1,296 දක්වා නගී. එහි වර්ෂයකට රුපියල් 1,044 වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස.—1959 මැයි 30 දිනට වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ ලියාපදිංචි කරනලද වින්නඹු සේවිකාවන් විය යුතුවත් හැර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයාගෙන් ප්‍රවීණතාව පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. සෞඛ්‍ය මණ්ඩල වැඩ පිළිබඳ පළපුරුද්ද ඇති, සිංහල හා දෙමළ කථා කළ හැකි අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

4. මේ ගැසට් පත්‍රයේ හතරවැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙල කොට 1959 මැයි 30 වැනි දිනට හෝ ඊට පළමු මට (පෞද්ගලික නමට නොවේ) ලැබෙන්නට එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 18 වැනි අංකය අතහරින්න.

6. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින තුනක් ඇතුළත ස්වකීය ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත් ඒ බව වහාම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දන්වා එවිය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත් තම ඉල්ලුම්පත්‍රය සලකා බැලීම සඳහා කිසියම් හිමිකමක් වෙයිනම් එය නැතිවී යන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ වැඩ බලන සභාපති.

1959 මැයි 8 වැනිදා,
තැ. පෙ. 530,
කොළඹ.

---

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයේ සුසාන භූමි පාලක තනතුර

පළාත් පාලන සේවයේ සුසාන භූමි පාලක තනතුරක් සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. තෝරාගනු ලැබූ අයදුම්කරු පළමුවැනි වරට මීගමුව නගර සභාවට පත් කර යවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රුපියල් 750න් පටන්ගෙන අවුරුද්දකට රුපියල් 42 බැගින් 21 වරක් වැඩිවී රුපියල් 1,632 දක්වා නඟී. එහි රුපියල් 1,044 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) වයස.—1959 මැයි මස 29 වැනි දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා වයස 45ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී සිටිය යුතුවත් හැර උයන්වතු වැඩ හා කම්කරු පාලනය පිළිබඳව පළපුරුද්දක් ඔවුන්ට තිබිය යුතුය.

4. තෝරාගනු ලැබූ අයදුම්කරුට ඉරිදා දිනවල හා රජයේ නිවාඩු දිනවල වැඩ කිරීමට නියම කරනු ලැබේ. ඔහුට සුසාන භූමි ප්‍රදේශයෙහි ගෙවල් කුලියෙන් නිදහස් නිවාසයක් සපයනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ හතරවැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් වන ආකෘති පත්‍රයෙහි සාරානුකූලව පිළියෙළ කොට 1959 මැයි මස 29 දිනට හෝ ඊට පළමු මා වෙත (පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයේ 18 වැනි අංකය මෙසේ වෙනස් විය යුතුයි.

"18. උයන්වතු වැඩ හා කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්ද:——————.

7. සියලුම ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින 3ක් ඇතුළත, තම ඉල්ලුම්පත්‍රය ලැබුණු බව දන්වා එවනු නොලැබුවහොත්, ඒ බව වහාම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත දන්වා එවිය යුතුයි. මේ විධිවිධානයට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වුවහොත්, ඒ ඉල්ලුම්කරුට ස්වකීය ඉල්ලුම්පත්‍රය සලකා බැලීම සඳහා යම්කිසි හිමිකමක් වෙයිනම් එය නැතිවී යන්නේ ය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ වැඩ බලන සභාපති.

1959 මැයි 4 දින,
තැ. පෙ. 530,
කොළඹ.

# අතුරු ව්‍යවස්ථා

ජීබී 14/43/5.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නොටෙල් පිටිය ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව වශී 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතව එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි 4, කොළඹ.

### නිලධාරීන් හා මෙහෙකරුවන් සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා

1. කාර්ය සභාවට ලැබිය යුතු සියලුම අයබදු හා ගාස්තු එකතු කොට කාර්ය සභාවේ මුද්‍රාව හා ප්‍රධාන තුමාගේ අත්සනේ නිවැරදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස ප්‍රධාන තුමා විසින් ඕනෑම නිලධාරියෙකුට හෝ වෙනත් කෙනෙකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

2. කිසිවකු විසින්—

(ඒ) ගම්සභා ආඥපනතෙන් හෝ ඒ ආඥපනතේ හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවල හෝ යම් විධි විධානයක් යටතේ හෝ ප්‍රධාන තුමාට හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකුට පවරා ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉටුකිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යයක් ක්‍රියාවේ යෙදවීමේදී එකී ප්‍රධාන තුමාට හෝ නිලධාරියාට, හෝ

(බී) කාර්ය සභාවෙන් හෝ කාර්ය සභාව වෙනුවෙන් රක්ෂාවට යොදා ගන්නා ලද යම් මෙහෙකරුවෙකුට හෝ වැඩකරුවෙකුට ප්‍රධානතුමා විසින් හෝ කාර්ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී ඒ මෙහෙකරුවාට හෝ වැඩකරුවාට හෝ ඕනෑකමින් බාධා නොකළ යුතුයි.

3. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්ය සභාව" යනුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ නොටොල් පිටිය ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

---

ප. පා.—ජීසී. 14/18.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දව ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි 7 දින,
කොළඹ.

### අප්‍රසන්නවූ හා අන්තරාදායක කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. (1) පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායක වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කොප්පරා සෑදීම ;
(2) කබොක්ගල්, බොරළු හෝ කළුගල් ලබාගැනීමට වලවල් කැපීම ;
(3) කපාපු පොල් වියලා සකස් කිරීම ;
(4) කොප්පරා ගබඩා කිරීම ;
(5) පිදුරු ගබඩා කිරීම ;
(6) මිනිරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම ;
(7) යන්ත්‍රසූත්‍ර මාගීයෙන් පොල් තෙල් සිඳීම ;
(8) සෙක්කුවෙන් පොල් තෙල් සිඳීම ;
(9) පැඟිරි තෙල් සිඳීම ;
(10) කෙඳි වශී තෙලීම හා ගබඩා කිරීම ;
(11) කුරුඳු තෙල් සිඳීම ;
(12) කපු පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම ;
(13) දර මඩුවක් තබා ගැනීම ;
(14) සවර්ණාභරණ සෑදීම ;
(15) කම්හලක් තබා ගැනීම ;
(16) බුමිතෙල් ගබඩා තබා ගැනීම ;
(17) මුද්‍රණ යන්ත්‍රාලයක් තබා ගැනීම ;
(18) අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම ;
(19) හාල් මෝලක් තබා ගැනීම ;
(20) සෝඩා, ලෙමනඩ් ආදි සිසිල් බීම වශී සෑදීම.

(2) පහත දක්වෙන කර්මාන්ත අප්‍රිය කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම ;
(2) තොග ගණනේ හෝ සිල්ලරට විකිණීම පිණිස නරක් වන සුළු ආහාර හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම ;
(3) කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම ;
(4) විනාකිරි සෑදීම ;
(5) සබන් සෑදීම ;
(6) හම් පදම් කරන ස්ථානයක් තබා ගැනීම ;
(7) පුවක් වියලා සකස් කිරීම ;
(8) සතුන්ගේ ලේ හෝ මලකුණු උණු කිරීම ;
(9) සතුන්ගේ හම් ගබඩා කිරීම ;
(10) සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම ;
(11) මාළු අයිස් දැමීම ;
(12) ලැලි පොගවා සකස් කිරීම ;
(13) රබර් සීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සීම හෝ සෑදීම ;
(14) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය හෝ ගෝනි තුනකට වඩා ගබඩා කිරීම ;
(15) කෝඩා සෑදීම ;
(16) දුම්කොළ වියලා සකස් කිරීම ;
(17) සුරුට්ටු සෑදීම ;
(18) පැණි හකුරු සෑදීම ;
(19) රා එකතු කිරීමේ ස්ථානයක් තබා ගැනීම ;
(20) බීඩි සෑදීම ;
(21) පොල් ලෙලි පෙඟවීම පිණිස පොල් ලෙලි කොටුවක් තබා ගැනීම.

(3) පහත දක්වෙන කර්මාන්ත අන්තරාදායකවූද අප්‍රිය වූද කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කෙඳි සායම් කිරීම ;
(2) ගඩොල් හෝ උළු පිලිස්සීම ;
(3) බැටරි චාජ් කිරීම ;
(4) හුණුගල් පිළිස්සීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලි වලට කැඩීම.

ඇල් ජීඩී—ජීසී 14/33.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කළුගමුව ගම්ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 5 වෙනි දින,
කොළඹ.

#### ගොඩනැගිලි සෑදීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. කිසිවකු විසින් ගම්ප්‍රදෙශය තුළ—

(අ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි විසිපහක දුර ප්‍රමාණයක් ඇතුළත,

(ආ) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත් කරනු ලැබිය හැකි යයි කාරක සභාව විසින් දැනුම්දෙනු ලැබුවාවූ ඕනෑම ගම්බද අඩි පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඇ) මේ අතුරු ව්‍යවස්ථාවේ (ආ) උප ඡේදයේ සඳහන් කරන ලද අඩි පාරකින් බාහිරවූ ඕනෑම ගම්බද අඩි පාරක් මැද සිට අඩි හයක දුර ප්‍රමාණයක් ඇතුළත

කිසිම අලුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් හෝ සෑදීම නොකළ යුතුයි.

2. කිසිවෙකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරන ලද ඕනෑම කරත්ත පාරක් හෝ අඩි පාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදීම නොකළ යුතුයි.

3. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධාන තුමා" යනුවෙන් ගම්කාරක සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාරක සභාව" යනුවෙන් ගම් ප්‍රදෙශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදෙශය" යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කළුගමුව ගම් ප්‍රදෙශය අදහස් කරනු ලැබේ.

---

ප. පා. දෙ.—ජීසී. 14/33.

### ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කළුගමුව ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලන අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි 7 වැනි දින,
කොළඹදීය.

#### අතුරු ව්‍යවස්ථාව

1954ක්වූ දෙසැම්බර් මස 3 වැනි දින අංක 10,741 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අන්තරායදායකවූ හා අප්‍රසන්නවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1. එහි (ඒ) ඡේදයෙහි (21) වැනි කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අළුත් කාරණා යෙදීමෙනි :—

"(22) බයිසිකල් අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් තබාගැනීම.

(23) මෝටෝ රථ වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් තබාගැනීම.

(24) වඩුවැඩ කරන වැඩපොළක් තබාගැනීම.

(25) ලී ඉරණ මෝලක් තබාගැනීම.

(26) ගෘහභාණ්ඩ සෑදීම.

(27) විකිණීම පිණිස වී ගෝනි හෝ මලු 15කට වඩා ගබඩාකර තබාගැනීම.

(28) පැඟිරි තෙල් හිඳීම.

(29) කුරුඳු තෙල් හිඳීම්" හා

2. එහි (බී) ඡේදයෙහි (18) වැනි කාරණය එක්කම ඊළඟට පහත සඳහන් අළුත් කාරණා යෙදීමෙනි :—

"(19) මිණීපෙට්ටි සෑදීම.

(20) යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ තුනපහ ඇඹරීම හෝ කුඩු කිරීම."

---

ඇල්. සී.—බී. 14/46/ඇල් ජීඩී—ජීජේ 9/16/1.

### ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදෙශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශන යෙන් සංශෝධිත එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමැතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 මැයි මස 5 වෙනි දින,
කොළඹදීය.

ගොඩකවෙල වෙළඳපොළේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භය ඇති චක්‍රයක් ඇතුළතවූ ප්‍රදේශය එකී වෙළඳපොළ සඳහා වූ වෙළඳ පොළ ප්‍රදේශය වශයෙන් මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

---

## විවිධ දැන්වීම්

### අලව්ව ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථාන යෙහි 1959 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී බලපත්‍රය නිකුත්කිරීම ගැන අලව්ව ගම් ප්‍රදේශයේ ගම්කාරක සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඈ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

#### උපලේඛනය

ඉල්ලුම්කරුගේ නම : ඩබ්ලිව්. ඇස්. පෙරේරා, කොහොලාන ; ස්ථානය : අලව්ව කඩමණ්ඩිය ; වෙළඳාම : හරක් මස් සහ එළුමස්.

යූ. බී. අලව්ව,
අලව්ව ගම්කාරක සභාවේ ප්‍රධානතැන.

ගම්කාරක සභා කාර්යාලය,
අලව්ව, 11.5.59.